ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය - 2010

-----------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම**

----------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී .ල.ගි.ප්‍ර. 18

----------------------

මූල්‍ය ප්‍රකාශනවල වෙනම පෙන්විය යුතු රු.7,899,912 ක් වූ ප්‍රත්‍යාගණන සංචිතය සමුච්චිත අරමුදලට එකතු කර මල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී .ල.ගි.ප්‍ර. 03

----------------

ජංගම වත්කම් යටතේ දැක්වියයුතු බැංකු ඉතිරි කිරීමේ ගිණුම් දෙකක ශේෂ එකතුව වූ රු.14,621,648 ක් ශේෂ පත්‍රයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

## 1.2.2 ගණම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්‍රාම වැටුප් අරමුදලට බැර කළයුතු දායකයින්ගේ විශ්‍රාම වැටුප් අරමුදලින් ගෙවන ලද ආපදා ණය සඳහා ලැබුණු රු.136,801 ක වූ පොලය සහ ආපදා ණය ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණ මුදල් තැන්පත් කිරීමෙන් ලැබුණු රු.89,441 ක් වූ පොලී, ආදායම් වියදම් ගිණුමේ පොලී ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි, මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය යටතේ අභ්‍යන්තර අරමුදල් වලින් ජනනය වූ ශුද්ධ ලැබීම් රු.278,789,530 ක් වියයුතු වුවද, රු.278,514,902 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) 2006 මාර්තු මාසයේ සිට 2010 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ඉතිරි කිරීමේ ගිණුමකට සෘජුවම බැර වී තිබුණු රු.965,786 ක මුදල් නිසි පරිදි හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2005 ඔක්තොබර් මාසයේ සිට 2009 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ඉතිරි කිරීමේ ගණුමක තැන්පත් කළ රු.92,711 ක් බැංකු ගිණමට බැර වී නොතිබුණි.

## 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

සාක්ෂි නොමැති වීම හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ දැක්වෙන රු.8,577,618 ක් වූ හඳුනා නොගත් මුදල් ශේෂය විගණනයේද සතුටුදායක ලෙස සතොව්ක්ෂණය කිරීමට නොහැක විය.

### 1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 110 | මණ්ඩලය අලාභ හානි ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) මු.රෙ. 316 හා 341 | උප පත්‍රිකා පොත් ආරක්ෂිත ස්ථානයක තබා නොතිබුණු අතර උප පත්‍රිකා පොත් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iii) මු.රෙ. 754 | බඩු ලේඛන පොත් තුලනය කර ශේෂ ඉදිරියට ගෙන යාමෙන් තොරව අතිරික්තතා ඌනතා සටහන් කරමින් භෞතික ශේෂය ඉදිරියට ගෙන ගොස් තිබුණි. |
| (iv) මු.රෙ.757(2)(අ) හා 756 | භාණ්ඩ සමීක්ෂණය කර අදාල වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. |
| (v) මු.රෙ. 770 (2) සහ (3) | 2009 දෙසැම්බර් 31 දිනට භාවිතයෙන් ඉවත් කර ඇති භාණ්ඩ සම්බනධයෙන් අපහරණ ක්‍රියාවලිය ඉටුකර නොතිබුණි. |
| (vi) මු.රෙ.1645(අ), 1646 හා 1647(ඉ) | ලොග් පොත් හා වාහන ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර, ධාවන සටහන් විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) අංක පීඩී 25(3) දරණ හා 2004 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රු. 1,085,981,258 ක ආයෝජන සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) 2007 පෙබරවාරි 26 දිනැති අංක 424 දරන රාජ්‍ය මුදල් | කාර්යාලයේ සියළුම දුරකථන සඳහා එක් බිල්පතකින් දුරකථන ඇමතුම් ගාස්තු ගෙවීම් කර |

| | | |
|---|---|---|
| | චක්‍රලේඛය | තිබුණද ඒ ඒ නිලධාරියාගේ ඇමතුම් ගාස්තු වෙන් වෙන්ව හඳුනා ගැනීමට හැකිවන පරිදි දුරකථන පද්ධතිය සකස් වී නොතිබුණි. |
| (ඇ) | 1997 ජූලි 09 දිනැති අංක 21/ජූලි/03/96 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සභාපතිගේ ලිපිය | තැපැල් කාර්යාල හා උපතැපැල් කාර්යල වලින් එකතු කර ගන්නා මුදල් මසක ඇතුළත මණ්ඩලය වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඉ) | සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2009 ඔක්තෝබර් 08 දිනැති මුදල් චකලේඛ අංක 05 | අවස්ථා 10 කදී ලබා දී තිබුණු රු.68,705 ක්වූ අතුරු අග්‍රිමයන් පියවා නොතිබුණු නමුත් පියවීම නොකළ නිලධාරීන්ගේ ආසන්නතම වැටුපෙන් එම මුදල අය කර නොතිබුණි. |

### 1.2.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී වාහන දෙකක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.298,615 ක් වැයකර තිබුණද, එම අළුත්වැඩියා සඳහා අනුමැතිය, මිල කැඳවීම් හා ගෙවීමට අදාල බිල්පත් ලිපිගොනුව තුළින් අනාවරණය නොවුණි. වාහන අළුත්වැඩියා කිරීමට පෙර හා අළුත්වැඩියාව නිසි පරිදි ඉටු වී ඇතිද යන්නත් කාර්මික නිලධාරියෙකු ලවා සහතික කර ගෙන නොතිබුණි.

(ආ) විධිමත් අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා බීඑම්/168/2010/14 අනුමැතිය මත 2010 ජූනි 01 දින සිට ආයතනයේ සියළුම ස්ථිර සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දී තිබුණි. සේවකයින්ගේ වැටුපෙන් හා සමාජ ආරක්ෂණ අරමුදලින් 50% බැගින් දායකත්වය සපයා දී තිබූ අතර, 2010 වර්ෂය සඳහා සමාජ ආරක්ෂණ අරමුදලින් විශ්‍රාම වැටුප් අරමුදලට ලබා ගත් මුදල රු.1,802,857 කි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 2.1 මූල්‍ය සමාලෝචනය

### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ අරමුදල් මෙහෙයුම්වලින් රු.8,766,402 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා ඌනතාවය රු.2,072,300 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහ රු.6,694,102 ක තවදුරටත් පිරිහීමක් වූ අතර ඒ සඳහා පුද්ගල පඩිනඩි, විශ්‍රාම පාර්තෝෂික ප්‍රතිපාදන, නිල ඇඳුම්, ඉන්ධන, ලිපි ද්‍රව්‍ය සැපයීම ඇතුළු වෙනත් වියදම් වැඩිවීම බලපා තිබුණි.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) දායකයන් බඳවා ගැනීම

2010 වර්ෂය සඳහා දායකයින් 100,000 ක් බඳවා ගැනීමට සැලසුම් කරමින් දිස්ත්‍රික්ක 22 ක් සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් 42 ක් පත්කර වාර්ෂික වැටුප් වශයෙන් රු.10,992,223 ක් ගෙවා තිබුණි. එහෙත් දායකයින් බඳවා ගැනීමේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොතිබූ අතර, සමස්ථ ඉලක්කයෙන් සපුරාගෙන තිබුණේ 41% කටත් වඩා අඩු ප්‍රමාණයකි. විස්තර පහත දැක්වේ.

| | දිස්ත්‍රික්කය | නිලධාරීන් සංඛ්‍යාව | වාර්ෂික වැටුප | බඳවාගත් දායකයින් සංඛ්‍යාව | | ඉලක්කයට ළඟා වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | | | රු. | ඉලක්කගත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | % |
| 1 | කොළඹ | 3 | 768,660 | 6000 | 363 | 6 |
| 2 | ගම්පහ | 2 | 528,780 | 6000 | 2200 | 37 |
| 3 | කළුතර | 2 | 510,720 | 6000 | 1143 | 19 |
| 4 | ගාල්ල | 2 | 528,780 | 5000 | 440 | 9 |
| 5* | මාතර | 2 | 515,880 | 7000 | 4502 | 64 |
| 6 | හම්බන්තොට | 2 | 557,040 | 3000 | 2352 | 78 |
| 7 | රත්නපුර | 2 | 500,400 | 3500 | 508 | 15 |
| 8 | කෑගල්ල | 2 | 554,460 | 5000 | 2306 | 46 |
| 9 | මහනුවර | 2 | 547,140 | 7000 | 2373 | 34 |
| 10 | මාතලේ | 2 | 526,200 | 4000 | 901 | 23 |
| 11 | නුවර එළිය | 1 | 265,176 | 3000 | 4003 | 133 |
| 12 | කුරුණෑගල | 2 | 468,360 | 8000 | 7611 | 95 |
| 13 | පුත්තලම | 2 | 563,520 | 4000 | 3614 | 90 |
| 14 | බදුල්ල | 2 | 526,200 | 4000 | 2904 | 73 |
| 15 | මොණරාගල | 3 | 847,920 | 3000 | 243 | 08 |
| 16 | අනුරාධපුරය | 3 | 779,919 | 5000 | 2870 | 57 |
| 17 | පොළොන්නරුව | 1 | 250,200 | 3000 | 37 | 01 |
| 18 | අම්පාර | 1 | 250,200 | 2000 | 178 | 09 |
| 19 | ත්‍රිකුණාමලය | 1 | 671,240 (19 හා 20) | 1500 | 50 | 03 |
| 20 | මඩකලපුව | 1 | | 2000 | 29 | 01 |
| 21 | වව්නියාව | 1 | 212,967 | 2000 | - | - |
| 22 | යාපනය | 3 | 618,461 | 5000 | 1094 | 22 |
| | සෘජු බඳවා ගැනීම් | - | - | 5000 | 1039 | 21 |

ළ

ණු දායකයින් සංඛ්‍යාව 62,759 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයෙදී එය 40,760 ක් විය. දායකයින් බඳවා ගැනීමේ ප්‍රමාණය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී 21,999 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

(ආ) ජංගම වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) කොළඹ දිස්ත්‍රික්කයේ ජංගම සේවා 45 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, පවත්වා තිබුණේ ජංගම සේවා 04 ක් පමණි. අනෙකුත් දිස්ත්‍රික්කයන්හි අවම වශයෙන් එක් ප්‍රධාන ජංගම සේවාවක් පැවැත්වීමට සැලසුම් කර තිබුනද, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව හා

මන්නාරම යන දිස්ත්‍රික්කවල කිසිදු ජංගම වැඩසටහනක් පවත්වා නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම පිළිබඳ ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් නිලධාරීන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා ස්වයංරැකියා පුහුණු වැඩමුළු ආදිය පැවැත්වීමට සැලසුම් කර තිබුණද, සැලසුම් කල පරිදි එම වැඩසටහන් පැවැත්වීමට අපොහොසත් වී තිබුණි.

### 2.2.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුක්‍රමික අංක සහිත කුවිතාන්සි පොත් නිකුත් කිරීම හා පාලනය සම්බන්ධව පාලනය සතුටුදායක මට්ටමක නොමැති අතර, මුදල් ලැබීම් හා ගිණුම්ගත කිරීම් නිවැරදි කිරීමට අවශ්‍ය පාලන ක්‍රම නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.
උදාහරණ වශයෙන් මහජනයාගෙන්/ ආයතනවලින් මුදල් එකතු කිරීමේදී නිකුත් කරනු ලබන කුවිතාන්සිවල පිටපත් මණ්ඩලයට නොලැබේ.

(ආ) බැංකු මගින් හා ග්‍රාම නිලධාරී මගින් දායක මුදල් රැස් කිරීමේදීද, අභ්‍යන්තර පාලන ක්‍රමයන්හි පවතින දුර්වලතාවයන් නිසා දායක මුදල්, මුදල් පොතට හා සාමාජිකයින්ගේ ගිණුම්වලට සටහන් කිරීමේ ප්‍රමාදයන් ඇතිවීම, බැංකුවලට ලැබෙන දායක මුදල් පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම හේතුවෙන් සාමාජිකයන්ගේ ගිණුම්වලට සටහන් නොවීම හා එම මුදල් දිගු කාලීනව හඳුනා නොගත් ලැබීම් වශයෙන් පවත්වාගෙන යාම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය.
වාරික මුදල් අය කිරීම හා ගිණුම්ගත කිරීමේදී පවතින ඉහත සඳහන් දුර්වලතාවයන් හේතුවෙන් පහත සඳහන් ගැටළු සහගත තත්වයන් නිරීක්ෂණය විය.

(i) එක් එක් සාමාජිකයාගේ ගිණුම්වල පවතින ශේෂයන්හි නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැක වීම.

(ii) සාමාජිකයා දායක මුදල් ගෙවුවද, එම මුදල් යාවත්කාලීන නොවීම මත ඔවුන්ට ආයතනය කෙරෙහි ඇති විශ්වාසය පළුදු වීම නිසා දායක මුදල් ගෙවීම අත්හැර දැමීම සිදු විය හැක. දායකයින් බඳවා ගැනීම සඳහා මෙන්ම දැනට සිටින සාමාජිකයින් රඳවා ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු නොවීම.

(iii) සාමාජිකයින් අක්‍රිය වීමට, ඔවුන්ගේ දායක මුදල් ගෙවීමේ දුර්වලතාවය පමණක් නොව ආයතනයේ තොරතුරු නිවැරදිව ගිණුම්ගත නොවීමද හේතු වී තිබුණි.

(iv) එමෙන්ම 2006 සැප්තැම්බර් 25 දිනැති ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 10(1), 10(2), 11 හා 13 යටතේ ඇති කොන්දේසි ක්‍රියාවට නගන්නේ කෙසේද යන්න.

### 2.2.3 විගණන හා කළමණාකරන කමිටු

-----------------------------------------

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජූනි 02 දිනැති පීඊඩී/12 චක්‍රලේඛය 7.4.1 ඡේදය ප්‍රකාර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් වර්ෂයකට 04 ක් පැවැත්විය යුතු වුවත් මණ්ඩලය විසින් රැස්වීම් පවත්වා තිබුණේ එක් වතාවක් පමණි.

## 3. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව මණ්ඩලයේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශෙෂ අවධානය යොමු කළ යුතුය.

(අ) සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයට දායකයින් බඳවා ගැනීම හා ලේඛනගත කිරීම

(ආ) තොග ලේඛන

(ඇ) අත්තිකාරම්